ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**පුවත්පත් නිවේදනය**

## ඉන්දියාව එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවන්ට කොවිඩ්-19 එන්නත සැපයීමට සූදානම් වේ

කොවිඩ් එන්නත් ගෝලීය යහපත උදෙසා ලබා දීමට ඉන්දියාව දක්වන කැපවීම අනුව එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවන් වෙනුවෙන් එන්නත් මාත්‍රා 200,000ක් ඉන්දියාව විසින් ලබා දෙන බව 2021 පෙබරවාරි 17 වන දින විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා ප්‍රකාශ කළේය. මෙය ගෝලීය සෞඛ්‍ය උදෙසා මෙන්ම ඉන්දියාව විසින් විශාල දායකත්වයක් ලබා දෙන බහු පාර්ශවීයත්වය, එක්සත් ජාතීන්ගේ පද්ධතීන් සහ සාම සාධක හමුදාවන් උදෙසා ඉන්දියාව දක්ව දැඩි කැපවීම පෙන්නුම් කරයි.

2. එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක හනා සිංගර් මහත්මිය 2021 පෙබරවාරි 18 වන දින මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා සමඟ පැවති හමුවකදී මේ සම්බන්ධයෙන් සිය ප්‍රශංසාව පළ කළාය.

3. ලෝකයේ ඖසු සල යනුවෙන් හැඳින්වෙන ඉන්දියාව ගෝලීය එන්නත් නිෂ්පාදන ධාරිතාවයෙන් 25%කට දායකත්වය ලබා දේ. #වැක්සින්මෛත්‍රී වැඩසටහන යටතේ ඉන්දියාව විසින් නිෂ්පාදනය කරන ලද එන්නත් මාත්‍රා මිලියන ගණනක් රටවල් 25කට ලබා දී ඇති අතර ඉන් වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත්තේ ප්‍රදාන වශයෙනි. මෙයට අමතරව, උතුරු ඇමරිකානු, ලතින් ඇමරිකානු, කැරිබියානු දූපත්, පැසිෆික් රටවල් ඇතුළු ලොව විවිධ රටවලට නුදුරේදීම ඉන්දියාවෙන් එන්නත් හිමි වනු ඇත. ඉන්දියාව COVAX වැඩසටහන සඳහා ද වැදගත් සැපයුම් මූලාශ්‍රයකි.

4. රටවල් 150කට අධික සංඛ්‍යාවකට තීරණාත්මක ඖෂධ, ශ්වසන ආධාරක යන්ත්‍ර, පෞද්ගලික ආරක්ෂක කට්ටල ලබා දෙමින් ඉන්දියාව කොවිඩ්-19 වසංගත තත්ත්වයේදී ආදර්ශමත් නායකත්වයක් ප්‍රදර්ශනය කර ඇත. මෙයින් රටවල් 80ක් සඳහාම මෙම ද්‍රව්‍ය ලබා දී ඇත්තේ ප්‍රදාන වශයෙනි.

5. වසංගතයට මුහුණ දීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සමීපව කටයුතු කරමින් සිටියි. මෙම ඒකාබද්ධ ප්‍රයත්නයේදී ඉන්දියාව ටොන් 26ක වෛද්‍ය සැපයුම් ද කොවිඩ්-19 එන්නත්

මාත්‍රා 500,000ක් ද ශ්‍රී ලංකාවට ලබා දී ඇත. මෙම සහයෝගීතතාවය තවදුරටත් තහවුරු කරමින්, ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සංකල්පයක් අනුව බිහිවූ කොවිඩ්-19 සාක් හදිසි අරමුදල සඳහා දෙවනුවට වැඩිම දායකත්වයක් ලබා දුන්නේ ශ්‍රී ලංකාවයි.

***

***කොළඹ***
***2021 පෙබරවාරි 18***